OL/2018/64/S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**64 S I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2018**

දෙවන බස - සිංහල I, II
இரண்டாம் மொழி - சிங்களம் I, II
**Second Language - Sinhala I, II**

**2018.12.12 / 0830 - 1140**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

வினாப்பத்திரத்தை வாசித்து, வினாக்களைத் தெரிவுசெய்வதற்கும் விடை எழுதும்போது முன்னுரிமை வழங்கும் வினாக்களை ஒழுங்கமைத்துக் கொள்வதற்கும் **மேலதிக வாசிப்பு நேரத்தைப்** பயன்படுத்துக.

Use **additional reading time** to go through the question paper, select the questions and decide on the questions that you give priority in answering.

## දෙවන බස - සිංහල I இரண்டாம் மொழி - சிங்களம் I Second Language - Sinhala I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට උත්තර සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරා ගන්න.
(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**கவனிக்க :**

(i) **எல்லா** வினாக்களுக்கும் விடை எழுதுக.
(ii) **1** தொடக்கம் **40** வரையுள்ள வினாக்கள் ஒவ்வொன்றிலும். (1), (2), (3), (4) என எண்ணிடப்பட்ட விடைகளில் **சரியான அல்லது மிகப் பொருத்தமான** விடையைத் தெரிவுசெய்க.
(iii) **உமக்கு வழங்கப்பட்டுள்ள விடைத்தாளில் ஒவ்வொரு வினாவுக்கும் உரிய வட்டங்களில் உமது விடையின் எண்ணை ஒத்த வட்டத்தினுள்ளே புள்ளடியை (X) இடுக.**
(iv) அவ்விடைத்தாளின் மறுபக்கத்தில் தரப்பட்டுள்ள மற்றைய அறிவுறுத்தல்களையும் கவனமாக வாசித்துப் பின்பற்றுக.

**Note :**

(i) *Answer **all** questions.*
(ii) *In each of the questions from **1** to **40**, pick one of the alternatives (1), (2), (3), (4) which you consider is **correct or most appropriate.***
(iii) ***Mark a cross (X) on the number corresponding to your choice in the answer sheet.***
(iv) *Further instructions are given on the back of the answer sheet. Follow them carefully.*

- අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවල, **තද කළු අකුරෙන්** මුද්‍රිත පදය වෙනුවට යෙදිය හැකි වඩාත් සුදුසු පද යුගලය තෝරන්න.

  **1** தொடக்கம் **5** வரையுள்ள வினாக்களில் **தடித்த எழுத்தில்** தரப்பட்டுள்ள சொற்களுக்குப் பதிலாக இடத்தக்க மிகவும் பொருத்தமான சொற்சோடியைத் தெரிவு செய்க.

  In questions **1** to **5**, select the most suitable pair of words for the word printed in **bold letters.**

**1.** **මාත්තෙක්ක** සෙල්ලම් කරන්න එන්න.
(1) මාත් තෙක්ක (2) මමත් තෙක්ක (3) මාත් එක්ක (4) මා තෙක්ක

**2.** බැංකුවෙන් **සල්ලිත්තරන්** එන්න.
(1) සල්ලිත් තරන් (2) සල්ලිත් අරන් (3) සල්ලි අරන් (4) සල්ලි තරන්

**3.** උදේට බත් **කන්නැත්තෙ** ඇයි?
(1) කන් නැත්තෙ (2) කන්න නැත්තෙ (3) කන්නෙ නැත්තෙ (4) කන්න ඇත්තෙ

[ 2 වැනි පිටුව බලන්න / பக். 2 ஐப் பார்க்க / *see page two*

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

4. දැන් පෙරහැර **ඉවරැති.**
(1) ඉවර ඇති (2) ඉවර රැති (3) ඉව රැති (4) ඉවර එති

5. අපි හෙට බැංකුවට **යන්නෝනැ.**
(1) යන් නෝනැ (2) යන්නෝ නැ (3) යන්න නෝනැ (4) යන්න ඕනැ

- අංක **6** සිට **10** තෙක් ප්‍රශ්නවල දී ඇති පද අතුරෙන් **නිවැරදි උච්චාරණය** සහිත පදය තෝරන්න.
**6** தொடக்கம் **10** வரையான வினாக்களில் தரப்பட்டுள்ள சொற்களில் **சரியான உச்சரிப்பைத்** தரும் சொல்லைத் தெரிவு செய்க.
In questions **6** to **10,** select the word with **correct pronounciation** from the words given.

6. (1) නකර ශාලාව (2) නගර ශාලාව (3) නගර ශලාව (4) නහර ශාලාව
7. (1) ක්‍රීඩා සමාජය (2) ක්‍රීටා සමාජය (3) කිරිඩා සමාජය (4) ක්‍රීඩා සමායය
8. (1) ගඩුල්ල (2) කටුල්ල (3) කඩුල්ල (4) හඩුල්ල
9. (1) දෙපාර්දමේන්තුව (2) ඩිපාට්මේන්තුව (3) දෙපාර්මේන්තුව (4) දෙපාර්තමේන්තුව
10. (1) විද්දියාලය (2) විද්‍යාලය (3) විත්තියාලය (4) විත්යාලය

- අංක **11** සිට **14** තෙක් ඇති එක් එක් ප්‍රකාශය සඳහා **වඩාත් ගැළපෙන** ප්‍රශ්නය තෝරන්න.
**11** தொடக்கம் **14** வரையான ஒவ்வொரு கூற்றுக்கும் **மிகப்பொருத்தமான** வினாவைத் தெரிவு செய்க.
In questions **11** to **14,** select the **most appropriate** question for the given statement.

11. බැංකුව තියෙන්නේ අතන.
(1) බැංකුවට තියෙන්නේ කොහෙ ද? (2) බැංකුවක් තියෙනවා කොහෙ ද?
(3) බැංකුව තියෙන්නේ කොහෙ ද? (4) බැංකුව තියෙනවා කොහෙ ද?

12. මට ගීත ගයන්න පුළුවන්.
(1) ඔයාට ගීත ගයන්න පුළුවන් ද? (2) ඔයා ගීත ගයන්න පුළුවන් ද?
(3) ඔයා ගීත ගයන්නේ පුළුවන් ද? (4) ඔයාට ගීත ගයන්නේ පුළුවන් ද?

13. කමල් බත් කන්න කැමතියි.
(1) කමල්ට කන්න කැමති මොනවා ද? (2) කමල් කන්න කැමති මොනවා ද?
(3) කමල් කන්නේ කැමති මොනවා ද? (4) කමල් කනවා කැමති මොනවා ද?

14. නිලානිට අවුරුදු දහ අටයි.
(1) නිලානිගේ වයස කෝක ද? (2) නිලානිගේ වයස කොයි එක ද?
(3) නිලානිගේ වයස කීයක ද? (4) නිලානිගේ වයස කීය ද?

- අංක **15** සිට **17** තෙක් ප්‍රශ්නවල **නිවැරදි ව අකුරු** යෙදී ඇති පදය තෝරන්න.
**15** தொடக்கம் **17** வரையான வினாக்களில் **சரியான எழுத்துக் கூட்டலைக்** கொண்ட சொல்லைத் தெரிவு செய்க.
In questions **15** to **17,** select the word with **correct spellings.**

15. (1) ප්‍රදර්ෂණය (2) ප්‍රදර්ශණය (3) ප්‍රදර්ෂනය (4) ප්‍රදර්ශනය
16. (1) අධිෂ්ටානය (2) අධිස්ඨානය (3) අධිෂ්ඨානය (4) අධිශ්ටානය
17. (1) සංඛ්‍යාව (2) සංක්‍යාව (3) සංඛියාව (4) සන්ක්‍යාව

- අංක **18** සිට **20** තෙක් ප්‍රශ්නවල **නොගැළපෙන** පදය තෝරන්න.
**18** தொடக்கம் **20** வரையான வினாக்களில் **பொருத்தமற்ற** சொல்லைத் தெரிவு செய்க.
In questions **18** to **20,** select the **inappropriate** word.

18. (1) බටහිර (2) ගිනිකොන (3) නිරිත (4) උතුර
19. (1) බැලීම (2) නැරඹීම (3) නැටීම (4) දැකීම
20. (1) කෙසෙල් (2) දඹල (3) අලිගැටපේර (4) දොඩම්

[ 3 වැනි පිටුව බලන්න / பக். 3 ஐப் பார்க்க / *see page three*

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

10326

- අංක **21** සිට **23** තෙක් ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් දෙන පදය** තෝරන්න.
**21** தொடக்கம் **23** வரையான வினாக்களுக்காக ஆரம்பத்தில் தரப்பட்ட சொல்லுக்கு **ஒத்தகருத்தைத் தரும் சொல்லைத்** தெரிவு செய்க.
In questions **21** to **23**, select the **synonym** for the word given at the beginning.

**21.** ලස්සන : (1) පියකරු (2) බියකරු (3) ප්‍රසිද්ධ (4) ජනප්‍රිය

**22.** සෙනෙහස : (1) මදහස (2) සුන්දර (3) ආදරය (4) අදහස

**23.** ආමන්ත්‍රණය : (1) මන්තය (2) ඇමතුම (3) ඇමුණුම (4) ඇරයුම

- අංක **24** සහ **25** ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට **විරුද්ධාර්ථයක් දෙන පදය** තෝරන්න.
**24** மற்றும் **25** ஆகிய வினாக்களுக்காக ஆரம்பத்தில் தரப்பட்ட சொல்லுக்கு **எதிர்க்கருத்தைத் தரும்** சொல்லைத் தெரிவு செய்க.
In questions **24** and **25**, select the **antonym** for the word given at the beginning.

**24.** තරුණ : (1) මහලු (2) ළමා (3) කුඩා (4) ළදරු

**25.** උස : (1) උඩ (2) කෙටි (3) යට (4) මිටි


- අංක **26** සිට **28** තෙක් එක් එක් ප්‍රශ්නයේ දී ඇති පින්තූරය සඳහා **වඩාත් ගැළපෙන ප්‍රකාශය** තෝරන්න.
**26** தொடக்கம் **28** வரையான ஒவ்வொரு வினாவிலும் தரப்பட்ட படங்களுக்கான **மிகப் பொருத்தமான கூற்றைத்** தெரிவு செய்க.
In each question from **26** to **28**, select the **most suitable statement** for the picture given.

**26.** 

(1) රෝගීන්ට පමණි
(2) හදිසි ප්‍රතිකාර පමණි
(3) රෝහල ඉදිරියෙනි
(4) බෙහෙත් අලෙවි සැල

**27.** 

(1) මෙතැනින් පාර මාරු නොවන්න
(2) ළමයින් මාරුවන ස්ථානය ඉදිරියෙනි
(3) ළමයින්ට පමණක් වෙන් කර ඇති ස්ථානයකි
(4) ළමා උද්‍යානයක් ඉදිරියෙන් ඇත

**28.** 

(1) බස් අලෙවි සැල
(2) බස් අලුත්වැඩියා කරන ස්ථානය
(3) රථගාල ඉදිරියෙනි
(4) බස් රථ නැවතුම

- අංක **29** සහ **30** ප්‍රශ්නවලට **ගැළපෙන උත්තරය** තෝරන්න.
**29** மற்றும் **30** ஆகிய வினாக்களுக்குப் **பொருத்தமான விடையைத்** தெரிவு செய்க.
For questions **29** and **30**, select the **suitable answer.**

**29.** වන සතුන් නිදහසේ ජීවත් වන ස්ථානයකි.
(1) සතුන්වත්ත (2) උද්‍යානය (3) අභයභූමිය (4) ගම්මානය

**30.** පාසලක ප්‍රධානියා හැඳින්වීමට වඩාත් සුදුසු යෙදුම කුමක් ද?
(1) උසස් ගුරුතුමා (2) විදුහල් පාලකතුමා (3) විදුහල් ප්‍රධානතුමා (4) විදුහල්පතිතුමා

[ 4 වැනි පිටුව බලන්න / பக். 4 ஐப் பார்க்க / *see page four*

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

- අංක **31** සහ **32** ප්‍රශ්නවල වාක්‍ය දෙක බැගින් දී ඇත. එම වාක්‍ය දෙක එක් වාක්‍යයක් ලෙස **නිවැරදි ව** සම්බන්ධ කර **ලියා ඇති වාක්‍යය** තෝරන්න.

  **31** மற்றும் **32** ஆகிய வினாக்களில் இரு வாக்கியங்கள் தரப்பட்டுள்ளன. அந்த இரு வாக்கியங்களையும் இணைத்து ஒரு வாக்கியமாக்கி **சரியாக எழுதப்பட்ட வாக்கியத்தைத்** தெரிவு செய்க.

  In questions **31** and **32,** two sentences are given. Select the **sentence** that **correctly** combines the two sentences.

**31.** සුළඟ හැමුවේ ය, ගස් කඩා වැටුණේ ය.
(1) සුළඟ හමා ගස් කඩා වැටුණේ ය. (2) සුළඟ හමන්නේ ගස් කඩා වැටුණේ ය.
(3) සුළඟ හමන්නට ගස් කඩා වැටුණේ ය. (4) සුළඟ හමමින් ගස් කඩා වැටුණේ ය.

**32.** මම බැංකු කාඩ්පත යන්ත්‍රයට ඇතුළු කළෙමි. මුදල් ලබා ගත්තෙමි.
(1) මම බැංකු කාඩ්පත යන්ත්‍රයට ඇතුළු වෙමින් මුදල් ලබා ගත්තෙමි.
(2) මම බැංකු කාඩ්පත යන්ත්‍රයට ඇතුළු කරන්නේ මුදල් ලබා ගත්තෙමි.
(3) මම බැංකු කාඩ්පත යන්ත්‍රයට ඇතුළු කර මුදල් ලබා ගත්තෙමි.
(4) මම බැංකු කාඩ්පත යන්ත්‍රයට ඇතුළු කර මුදල් ලබා ගන්නෙමි.

- අංක **33** සහ **34** ප්‍රශ්නවල හිස්තැනට **වඩාත් සුදුසු පදය** තෝරන්න.

  **33** மற்றும் **34** ஆகிய வினாக்களிலுள்ள இடைவெளிக்கு **மிகவும் பொருத்தமான சொல்லைத்** தெரிவு செய்க.

  In questions **33** and **34,** select the **most suitable word** for filling each blank.

**33.** අපි ...................................... අනුරාධපුරයට ගියා.
(1) දුම්රියට (2) දුම්රියෙන් (3) දුම්රිය (4) දුම්රියක්

**34.** සිරිමල් ...................................... වැඩ කරන්න.
(1) උනන්දුවෙන් (2) උනන්දුවට (3) උනන්දු (4) උනන්දුවක්

- අංක **35** ප්‍රශ්නයේ කළු කර ඇති සංඛ්‍යාව නිවැරදි ව අකුරෙන් ලියා ඇති උත්තරය තෝරන්න.

  **35** ஆம் வினாவிலுள்ள தடிப்பாக்கப்பட்டுள்ள எண்ணை சரியாக எழுத்துகளில் எழுதப்பட்ட விடையைத் தெரிவு செய்க.

  In question **35** select the answer that gives in letters correctly the number in bold print.

**35.** අර ගොඩනැගිල්ල අඩි **1841**ක් උස ය.
(1) එක්දහස් අටයි හතළිස් එක (2) එක්දහස් අටසිය හතළිස් එක
(3) එකසිය අසූ හතළිස් එක (4) එකයි අටසිය හතළිස් එක

- අංක **36** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයේ **ව්‍යාකරණානුකූල ව නිවැරදි** වාක්‍යය තෝරන්න.

  **36** தொடக்கம் **40** வரையான வினாக்களில் **இலக்கண ரீதியாக சரியான** வாக்கியத்தைத் தெரிவு செய்க.

  In each question from **36** to **40,** select the **gramatically correct** sentence.

**36.** (1) පාසලේ රැස්වීමක් පැවැත්වෙති. (2) පාසලේ රැස්වීමක් පැවැත්වෙයි.
(3) පාසලේ රැස්වීමක් පැවැත්වෙමි. (4) පාසලේ රැස්වීමක් පැවැත්වෙමු.

**37.** (1) අපි පන්සල් යන්න පිටත් වුණෙමු. (2) අප පන්සල් යන්න පිටත් වුණෙමු.
(3) අපි පන්සල් යන්න පිටත් වුණේ ය. (4) අපි පන්සල් යන්න පිටත් වුණෝ ය.

**38.** (1) ගුරුවරු උපහාර උළෙලට සහභාගි වූවා ය. (2) ගුරුවරුන් උපහාර උළෙලට සහභාගි වූහ.
(3) ගුරුවරු උපහාර උළෙලට සහභාගි වූවේ ය. (4) ගුරුවරු උපහාර උළෙලට සහභාගි වූහ.

**39.** (1) මම වෙළෙඳසැලට ගියෙමි. (2) මා වෙළෙඳසැලට ගියෙමි.
(3) මම වෙළෙඳසැලට ගියේ ය. (4) මම වෙළෙඳසැලට ගියෙමු.

**40.** (1) ගස් වැල් අපට සෙවණ දෙති. (2) ගස් වැල් අපිට සෙවණ දෙමු.
(3) ගස් වැල් අපට සෙවණ දෙමි. (4) ගස් වැල් අපට සෙවණ දෙයි.

* *

[ 5 වැනි පිටුව බලන්න / பக். 5 ஐப் பார்க்க / *see page five*

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

64 S I,II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2018

දෙවන බස - සිංහල I, II
இரண்டாம் மொழி - சிங்களம் I, II
Second Language - Sinhala I, II

දෙවන බස - සිංහල II　இரண்டாம் மொழி - சிங்களம் II　Second Language - Sinhala II

- **I** කොටසේ අංක **1** හා **2** ප්‍රශ්න ඇතුළු ව **II** කොටසින් **එක්** ප්‍රශ්නයක් ද **III** කොටසින් ප්‍රශ්න **දෙකක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් උත්තර ලියන්න.
  பகுதி **I** இல் **1 ஆம் 2 ஆம்** வினாக்கள் உட்பட பகுதி **II** இல் **ஒரு** வினாவையும் பகுதி **III** இல் **இரு** வினாக்களையும் தெரிவுசெய்து எல்லாமாக **ஐந்து** வினாக்களுக்கு மாத்திரம் விடை எழுதுக.
  Answer only **five** questions including questions **1** and **2** in Part **I** and selecting **one** question from Part **II** and **two** questions from Part **III**.

## I කොටස / பகுதி I / Part I

**1.** දී ඇති මාර්ගෝපදේශ ආශ්‍රය කර ගනිමින් පහත දැක්වෙන මාතෘකාවලින් **එකක්** ගැන **වචන 100**ක පමණ රචනයක් ලියන්න.

பின்வரும் தலைப்புகளுள் **ஒன்றைத்** தெரிவு செய்து அதன் கீழே தரப்பட்ட விடயங்களை உள்ளடக்கி ஏறத்தாழ **100 சொற்களில்** அமையுமாறு ஒரு கட்டுரை எழுதுக.

Write an essay of about **100 words** on any **one** of the following topics in accordance with the given guidelines.

(අ) මා ගිය අධ්‍යාපන චාරිකාවක්
   (i) චාරිකාව හැඳින්වීම
   (ii) චාරිකාව සඳහා පෙර සූදානම
   (iii) චාරිකාවේ දී නැරඹූ ස්ථාන
   (iv) විනෝද වූ ආකාරය
   (v) සමාලෝචනය

(ආ) අලුත් අවුරුදු උත්සවය
   (i) හැඳින්වීම
   (ii) අවුරුදු උත්සවය සඳහා සූදානම් වීම
   (iii) අවුරුදු දින සිදු කරන සිරිත් විරිත්
   (iv) අවුරුදු ක්‍රීඩා
   (v) සමාලෝචනය

(ඉ) පරිසරය රැක ගනිමු
   (i) හැඳින්වීම
   (ii) පරිසරයට අයත් දේවල්
   (iii) පරිසරය අපිරිසිදු වීම
   (iv) පරිසරය පිරිසිදු ව තබා ගැනීම
   (v) සමාලෝචනය


(ඊ) ගඟක් කතා කරයි
   (i) හැඳින්වීම
   (ii) ගඟේ ගමන් මග
   (iii) ඉටු කරන සේවය
   (iv) ආරක්ෂා කරගැනීමේ වැදගත්කම
   (v) සමාලෝචනය

[ 6 වැනි පිටුව බලන්න / பக். 6 ஐப் பார்க்க / see page six

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

( උ) දෙවන භාෂාවක් ඉගෙනීමේ වැදගත්කම
(i) හැඳින්වීම
(ii) ඉගෙනීමේ ප්‍රයෝජන
(iii) ඉගෙන ගත හැකි ක්‍රම
(iv) ඉගෙනීමට භාවිත කළ හැකි දේවල්
(v) සමාලෝචනය

**2.** දී ඇති පින්තූරය බලා, ඒ ඇසුරින් අර්ථවත් වාක්‍ය **පහක්** ගොඩනගන්න.
(වාක්‍යයක අවම වශයෙන් වචන **හතරක්වත්** තිබිය යුතු ය.)
தரப்பட்டுள்ள படத்தை அடிப்படையாகக் கொண்டு கருத்துள்ள **ஐந்து** வாக்கியங்கள் எழுதுக.
(ஒரு வாக்கியத்தில் குறைந்தபட்சம் **நான்கு** சொற்களாவது இருத்தல் வேண்டும்.)
Compose **five** meaningful sentences with reference to the given picture.
(There should be at least **four** words in a sentence).



## II කොටස / பகுதி II / Part II

- **3** හා **4** යන ප්‍රශ්නවලින් **එකකට** පමණක් පිළිතුරු සපයන්න.
  **3** ஆம் **4** ஆம் வினாக்களுள் ஏதேனும் **ஒரு** வினாவுக்கு மாத்திரம் விடை எழுதுக.
  From questions **3** and **4,** answer only **one** question.

**3.** පහත සඳහන් කවි පෙළ කියවා, අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.
பின்வரும் கவிதையை வாசித்து, அதன் கீழ் வினவப்பட்டுள்ள வினாக்களுக்கு விடை எழுதுக.
Read the following poem and answer the questions given.

සමන් පිච්ච මල් ඉහිරුණු
නිල් කණකොළ පිට්ටනියක්
වගෙයි අහස අන්න බලනු
කොච්චර ලස්සන ද රට

බකමූණෝ පියාඹති
අතික් කුරුල්ලෝ නිදති
බෝ අතුවල එල්ලීගෙන
මාවවුලෝ කෑ ගසති

මගෙ හුරතල් අක්කාගේ
මාලේ මුතු ඇට වාගේ
මේ වැටෙන්නෙ පිනි බින්දුත්
හදමු එකක් ඒ වාගේ

[ 7 වැනි පිටුව බලන්න / பக். 7 ஐப் பார்க்க / *see page seven*
Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

හඳහාමී අප දිහාව
එබී බලයි පා හිනාව
සිහිල් සුළං ඇල් විඳින්ට
දොරට යන්ට හොඳ වෙලාව

අහසේ තරු වැල් පිරිලා
පොළොවේ සුදු මල් පිපිලා
මඟුල් ගෙවල් දෙකක් වගෙයි
මේ දෙපළ ම හැඩ ගැහිලා

(i) මෙහි විස්තර කෙරෙන්නේ දවසේ කුමන වේලාවක් ද?
(ii) මෙහි සඳහන් වන කුරුලු වර්ග **දෙක** නම් කරන්න.
(iii) පිනි බින්දු සමාන කර ඇත්තේ කුමකට ද?
(iv) 'ගුවන' යන්නට සමාන වචනයක් කවිපෙළෙන් තෝරා ලියන්න.
(v) මෙහි මඟුල් ගෙවල් දෙකක් ලෙස හැඩ ගැසී ඇත්තේ මොනවා ද?

**4.** පහත දැක්වෙන ඡේදය කියවා, අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.
பின்வரும் உரைப்பகுதியை வாசித்து, அதன் கீழ் வினவப்பட்டுள்ள வினாக்களுக்கு விடை எழுதுக.
Answer the given questions with reference to the following paragraph.

කලවැල්ලාව ස්වභාවයෙන් ම පහත් බිම් ප්‍රදේශයකි. මෑතක සිට සෑම වසරකට ම දෙතුන් වතාවක් මේ ගම්මානය ජලයෙන් යට වෙයි. මෙහි වෙසෙන ජනතාව ගංවතුර කාලවල දී උස් තැනක පිහිටි ගමේ පාසලට හෝ පන්සලට ගොස් නවාතැන් ගනිති. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඔවුන්ට අවශ්‍ය පානීය ජලය, පිසූ ආහාර සහ වියළි ආහාර ද්‍රව්‍ය ලබා දෙයි.

ගංවතුර බැස යාමෙන් පසු ඔවුහු නැවත තම නිවෙස්වලට යති. ඔවුහු මේ ජීවන රටාවට දැන් දැන් පුරුදු ව සිටිති. මිනිසුන් විසින් ම කරනු ලැබූ මහත් පාරිසරික විනාශය නිසා මෙවැනි ආපදා තත්ත්වයක් ඇති වූ බව ගමේ පැරැන්නෝ පවසති.

(i) ගංවතුරෙන් යට වූ මෙහි සඳහන් ගම කුමක් ද?
(ii) ජනතාව ගංවතුර කාලවල දී නවාතැන් ගන්නා තැන් **දෙකක්** ලියන්න.
(iii) 'බීමට සුදුසු වතුර' යන්නට සමාන යෙදුමක් ඡේදයෙන් තෝරා ලියන්න.
(iv) ගංවතුරෙන් අසරණ වූ අයට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා දෙන්නේ මොනවා ද?
(v) ගංවතුර ඇති වීමට හේතුව ලෙස පැරන්නන් පවසන්නේ කුමක් ද?

## III කොටස / பகுதி III / Part III

- **5** හා **6** යන ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සපයන්න.
**5** மற்றும் **6** ஆகிய **இரண்டு** வினாக்களுக்கும் விடை எழுதுக.
Answer **both** questions **5** and **6**.

**5.** සේවයෙන් විශ්‍රාම ගත් 'ලස්සනගම' මහ විදුහලේ විදුහල්පති කමල් අබේරත්න මහතා වෙනුවෙන් උපහාර උළෙලක් පැවැත්වීමට ආදි ශිෂ්‍ය සංගමය තීරණය කර ඇත. එම උපහාර උළෙළ 2018.12.21 දින පෙ.ව. 10.00ට විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී පැවැත්වේ. විශේෂ ආරාධිත අමුත්තා ලෙස කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා සහභාගි වෙයි. මෙම තොරතුරු අදාළ කර ගනිමින් ආරාධනා පත්‍රයක් සකස් කරන්න. ආදි ශිෂ්‍ය සංගමයේ ලේකම් වත්සලා ගුණතිලක ඔබ යැයි සිතන්න.
தரப்பட்டுள்ள விடயங்களை உள்ளடக்கி அழைப்பிதழ் ஒன்று எழுதுக.
Prepare an invitation with relevant information.

**නැතහොත්**
**அல்லது**
**Or**

කෑගල්ල නගරයේ සිට වීරපුර ගමට යාමට ඇති මාර්ගය බෙහෙවින් අබලන් වී ඇත. මේ නිසා ගම්වාසීහු දැඩි අපහසුතාවලට මුහුණ දෙති. මෙම තත්ත්වය සලකා බලා කඩිනමින් මාර්ගය පිළිසකර කර දෙන මෙන් ඉල්ලමින් ප්‍රාදේශීය ලේකම්වරයාට යැවීමට ලිපියක් ලියන්න. ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් කසුන් දිසානායක ඔබ යැයි සිතන්න.
தரப்பட்ட விடயங்களை உள்ளடக்கி கடிதம் ஒன்று எழுதுக.
Write a letter according to the given guidelines.

[ 8 වැනි පිටුව බලන්න / பக். 8 ஐப் பார்க்க / *see page eight*

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**6.** පහත දැක්වෙන දෙමළ / ඉංග්‍රීසි වාක්‍ය **සිංහලට** පරිවර්තනය කරන්න.
கீழே தரப்பட்டுள்ள தமிழ் / ஆங்கில வாக்கியங்களை **சிங்களத்தில்** மொழி பெயர்க்க.
Translate the following Tamil / English sentences into **Sinhala**.

(i) தம்பியும் நானும் கடைக்குச் சென்றோம்.
(ii) அம்மா காலையில் பாற்சோறு சமைக்கிறாள்.
(iii) ரவியும் வருணவும் நல்ல நண்பர்கள்.
(iv) யானை உணவு தேடி கிராமத்திற்குச் சென்றது.
(v) மாமாவிடம் இருந்து எனக்கு கடிதமொன்று கிடைத்தது.

(i) My brother and I went to the shop.
(ii) Mother cooks milkrice in the morning.
(iii) Ravi and Waruna are good friends.
(iv) The elephant went to the village for food.
(v) I recieved a letter from uncle.

**නැතහොත්**
**அல்லது**
**Or**

ඔබ විදුලි උපකරණ අලුත්වැඩියා කරන පාඨමාලාවක් හැදෑරීමට බලාපොරොත්තු වන බව සිතන්න. එම පාඨමාලාව පවත්වනු ලබන ආයතනයේ කළමනාකරුගෙන් පාඨමාලාව ගැන තොරතුරු විමසීමට ඔබට අවශ්‍ය වේ. මෙහි දී ඔබ හා කළමනාකරු අතර සිදුවන සංවාදය පහත සඳහන් කරුණු උපයෝගී කර ගෙන ලියන්න.

உங்களுக்கும் முகாமையாளருக்கும் இடையே நடைபெறும் ஓர் உரையாடலை எழுதுக.

Write the dialogue that takes place between you and the manager.

(i) සුබ පැතීම
(ii) කළමනාකරු අසන ප්‍රශ්නවලට ඔබ දෙන පිළිතුරු
(iii) පාඨමාලාව පිළිබඳ ඔබ අසන තොරතුරු
(iv) කළමනාකරු ඔබට ලබාදෙන පිළිතුරු
(v) ස්තුති කිරීම

❊ ❊ ❊

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/